"මළමි සෙව වෙලා සාධයක් ගහමුදු?" අපේ මිතුරෙක් අපෙන් අසයි. සැබෑවක් අප තුළ හටගත් හැඟීම මම නාට්‍ය නම් ක්‍රීඩාවේ ශියැසලෙන ක්‍රීඩකයන් දෙදෙනෙකු බවට පත්වූ වගය. එසේ ගැසිය හැකි දේවල් බොහෝය. එහෙත් නාට්‍යයක් ගෙනත් කලා නිර්මාණයක් නිර්මාණය කළ යුතු වන්නේය. සවස 6.30 ට රංග ශාලාවට හොස් පැයක් හෝ දෙකක් වේදිකාව මත රග දැක්වූ නාට්‍යය නරඹා ගෙදර එන ප්‍රේක්ෂක ඔබ, ගතවූ පැය දෙක උදෙසා ඒ නිර්මාණය විකසිත වූ ආකාරය කෙසේ වන්නද අසන්දැ'යි මොහොතකට සිතා බැලීමට පෙළඹෙන්ද?

අද අපේ සුළු ප්‍රජාතිය ඒ ගමන් මග සරළව විදෙන පසමධය, නාවකතාකරුවනු, කෙටිකතාකරුවනු හෝ කවියෙකුට කොළයක්

මහාවාර්ය සුවරිත ගමිලත් විදේවිතානන් විටෙක නාට්‍ය රචකයා ගෘහ නිර්මාණ ශිල්පියෙකුට සම කළේය. එනම්, නාට්‍යයක් රචනා කිරීමට නම් ඔහු මනසෙහි මුළින්ම

පෑහෙක් අතර'නිව බාහිර ලෝකයෙන් මිදී තම නිර්මාණ බිහි කිරීමේ භාවයට අදත. සිත්තරුවාවද, එසේමය. එහෙත් නාට්‍යකරුවාට එසේ කළ හැකිද?

නාට්‍යය වූ කලී සාමූහික කලා මාධ්‍යයකි. අනෙකුත් කලාකරුවන්ට තිබෙන නිදසන නාට්‍යකරුවාට නොමැත. නවකතාකරුවාට, කවියාට, චිත්‍ර අඳින්නාට සිසිවාසුගේ දයකත්වයක් නොමැතිව තම නිර්මාණ බිහි කළ හැකි වුවද, නාට්‍යකරුවාට එසේ නොහැකි වනු අතත.

ප්‍රථමව නාට්‍ය වේදිකා ගත වනුයේ නාට්‍යය නම් දෘෂ්‍යකාව්‍ය රචකයාගේ මනස තුළය. තම සිත සසල කළාවූ යම් අත්දැකීමක් අසුරුන් කොට ගෙන ඊට තම දෘෂ්ටියද ආලේප කොට තවත් සහාද සිසියන් සමග එය බෙද හද, ගැඹීමේ මුළුම පියවර රචකයාගේ මනස තුළ පෙළ ගැසෙනු අතත. කතා ප්‍රවත, සංවාද, නළු නිළියන් හැසිරිය යුතු ආකාරය, වේදිකා-වේ ස්වරූපය, ආලෝකය, රංග භාණ්ඩ, රංග වස්ත්‍ර යනාදී සෑම පාර්ශවයක්ම රචකයා තම මනස් දරශය පරිදි පිටපතෙහි අන්තර්ගත කරනු අතත.

මහාචාර්ය සුවරිත ගමිලත් විදේවිතානන් විටෙක නාට්‍ය රචකයා ගෘහ නිර්මාණ ශිල්පියෙකුට සම කළේය. එනම්, නාට්‍යයක් රචනා කිරීමට නම් ඔහු වන නාට්‍ය අතරින් කීයෙන් කීයක් ස්ථානන්තු නිර්මාණය, පරිවර්තනය, පරාණි පිටපත්ද යන්න සිතා බැලීමේන් ඔබට පෙනෙනු අතත. මේ වූ කලී නාට්‍ය කලාවේ ඉදිරි ගමන් මගට ස්ථානන්තු නාට්‍ය රචකයින් ගේ මැදිහත්වීම අනිශය වැදගත් වන්නා වූ සමයක් වනු අතත.

කෙසේ හෝ නාට්‍ය රචකයා විසින් රචිත නාට්‍ය පෙළ (සැඳැස්ම) දෘෂ්‍ය කාව්‍යයක් බවට පත් කිරීමේ භාරදූර කාර්යයට උදෙසා මිළඟ ප්‍රධාන පුද්ගලයා අධ්‍යක්ෂකරුයාය.

මුලින්ම අධ්‍යක්ෂකවරයා නාට්‍ය පෙළ ගිසියාකාරව අවබෝධ කර ගත යුතුය. පසුව රචකයාගේ රසයට ඔහුගේ දෘෂ්ටිය මිශ්‍ර කිරීම ඉතාම වැදගත් වනු අතත. එහම් රචකයා සමග කතාබස් කිරීමෙන් තම සිතුම් පරිදි පිටපතෙහි මේ මේ තැන් මේ මේ අයුරින් වෙනස් වුවහොත් මේ අයුරින් නාට්‍ය වර්ධනය අධ්‍යක්ෂණය කළ අයුරුත් දෙයාකාර වන්නේය. බන්දුල ජයවර්ධනයන්ගේ බෙරහඬ නාට්‍ය පෙළ ඔහු විසින්ම අධ්‍යක්ෂණය කොට ඉතා ප්‍රකට නාට්‍ය නිෂ්පාදනයක් බවට පත් කළේය. පසු කලෙක තවත් අධ්‍යක්ෂකවරුද කීප දෙනෙකුම එම පෙළම අධ්‍යක්ෂණය කළඳ, මුළු නිෂ්පාදනය තරම් ප්‍රකට සාර්ථක තැලයකට ගෙන ඒමට ඔවුනට හොඳකි වීන.



රචකයා කුමන කාව්‍යයක් ලීවත්, අධ්‍යක්ෂක කුමන රූප මැවුවත් වේදිකාව මත නාට්‍යය ප්‍රේක්ෂකයා වෙතට ගෙන එනුයේ නාළවාය. සපිරිවූ ප්‍රේක්ෂකයන් ඉදිරියේ රඟපා පෙන්වනුයේ නාළවාය. තම රචිතයට ගිසියාකාරව පණ පෙවීමට නම් නාට්‍ය පෙළේ අධ්‍යක්ෂණයේ විවරණයත් නළවා විසින් ගිසියාකාරව වටහා ගැනීම අනිශය වැදගත්ය. එමෙන්ම පෙළේ තිබෙන ලෙඩේ කීමත්, අධ්‍යක්ෂකගේ අදහස් පරිදි වේදිකාවේ හැසිරීමේ පමණක් නළවා විසින් ඉටු කිරීම ප්‍රමාණවත් නොවෙයි. නළවා විසින් තම චරිතයට තමන්ගේ විවරණය එක් කළ යුතුය.

කලකට පෙර සිංහබාහු නාටකයේ සිංහයාගේ චරිතය නිරූපණය කළ මාක් ඇන්තනී එම චරිතය විවරණය කළ ආකාරයට වඩා ජයශ්‍රී චන්ද්‍රපීති ඒ චරිතය විවරණය කළ අයුරු වෙනස් වය. ජයශ්‍රී චන්ද්‍රපීති මැවූ සිංහයාගා රසිකයන් වඩාත් ආලය කළේය. පීරය නන්දසිරි මනමේ කුමරු වූ සැවිත් ගාමිණී සමරකෝන් මනමේ කුමරු වූ සැවිත් දෙයාකාර වය. නාට්‍යය රඟපා අවසන් වුවද කලින් කී දෙඛස්වල අරුත නොදැන්නා නළවාගු වෙයි නම් එය ඉතා අවාසනාවක් වන්නේය. ඊට අදාසකයන් වගකිව යුතුය. නළවාගේ විවරණය නාටකයේ සාර්ථකතාවය උදෙසා අනිශය වැදගත් වන්නකි.

රචක, අධ්‍යක්ෂක, නළු - නිළියන් සේම නාට්‍ය නිර්මාණයට එක්වන තවත් පිරිසකි.

වේශ නිරූපණ ශිල්පියා, සංගීත නිර්මාණ ශිල්පියා, රංග වස්ත්‍ර රංග භාණ්ඩ නිර්මාපකයන්, රංගාලෝක නිර්මාණ ශිල්පීන්, වේදිකා පරිපාලකයන්, තවත්ද නිර්මාණ ශිල්පීන් ආදී මෙහි නොකී බොහෝ මයකගේ මැදිහත්වීම සිදුවන්නේය. මේ සියළු දෙනා නාට්‍ය පෙළ සේම අධ්‍යක්ෂකගේ විවරණය ගිසියාකාරව අවබෝධ කර ගැනීමේන් හැදෑරීමේන් සිදු කළ යුතුය. පසුව තම තමුන්ගේ පාර්ශවයනට තමන්ගේ විවරණය එක් කළ යුතුය. මෙබේදී එකිනෙකාගේ සන්ති-වේදනයන් එකඟතාවයන් ඉතා වැදගත් වන්නේය.

නිදසුනක් ලෙස, සංගීත ශිල්පියා ගීතයක ඉතා ඉහළ ස්වරයකින් තනුවන් නිර්මාණය කරයි. නමුත් නළවාට එම උච්ච ස්වරයෙන් ගායනා කිරීම අපහසු වෙයි. එය සාර්ථක වෙයිද? ලලිතා සරවිචන්ද්‍රයන් නිර්මාණය කළ යෙර්මා නාටකයේ රොහාන් තෙත්තසිංහ සංගීතය නිර්මාණය කළේය. යෙර්මා චරිතය විසින් ගීත ගායනාවක් ගායනයට ගියිම වී තිබිණ. එම චරිතය නිරූපණය උදෙසා චාන්දනී සෙනෙවිරත්න තෝරා ගැණිණ. අවාසනාවකට අසයට උච්ච ස්වර ගායනයේ අපහසුතාවයක් විණ. රොහාන්ට තම තනුවළ ස්වර වෙනස්කම් කිළියට සරිලන පරිදින් නිර්මාණයට ගැලපෙන පරිදින් නවත සසස් කිරීමට සිදුවිය.

ඇංග රචනා ශිල්පියාට තම වේශ නිරූපණයන් උදෙසා වර්ණ තෝරා ගැනීමේදී රංග වස්ත්‍රවල වර්ණත්, රංගාලෝක ශිල්පියා භාවිතා කරන වර්ණත් නොතකා හැරිය නොහැකි වන්නේය. එකිනෙකාගේ සන්තිවේදනයන් තොරව, එකතකොයක් නොවව එම අංශයන් නිර්මාණය කළ නොහැක්කේය. කෙසේ හෝ වේවා නාට්‍යයක් රසිකයන් අතට පත් කරලීමේ ක්‍රියාවලියේ ගමන් මගත්, බරපතළ බවත්, කෙතරම් අපහසුද යන්නත් දැන් ඔබට සරළව මැවී පෙනෙනු ඇතැ'යි සිතන්නමි.

මේ අයුරින් නිර්මාණය වන නාට්‍ය වේදිකාවේ රඟ දැක්වූ පමණින් එය පරිපූර්ණ නොවන්නේය. එය නාට්‍යයක් විමට ප්‍රේක්ෂක සමූහයකගේ සහභාගිත්වයද අවශ්‍ය වනු අතත. නාට්‍යයක් සාර්ථකවීමට නම් නිසි ප්‍රේක්ෂක සමූහයකද සිටිය යුතුය. නිසි තැනට සිනාසෙන, දුක්වෙන, අත්පොළොසන් දෙන, නිසි තැනට නිසි ප්‍රතිචාරය දක්වන, නාට්‍යයේ ඇතුළත් දේ නිසියාකාරව වටහා ගන්නා පිරිසක් සිටීම නාට්‍යකරු ළබන්නාවූ හොත් භාග්‍යයක් වන්නේය.

සොඳුරු ආදාදායකයා ගේ විජිතය

මගසෙහි මුළින්ම නාට්‍යයක් බිහි විය යුතුය. ඔහු මගසෙහි පහළ වූ සැබෑවක සිදුවීමක් පෑන් නිළියන් මෙසේ සාවාද කිරමින් මේ මේ ආකාරයෙන් රචක පසවෝත්, වේදිකා පසුතල මෙසේ වුවහොත්, මෙවන් රංග භාණ්ඩ පාවිච්චි කළහොත්, පසුබිමේ මෙවන් සංගීතයක් වාදනය වුවහොත් මේ මේ රසිකයන් කිහි වේවි යැයි සිතාගෙන රචකයා පෙළ රචනා කරනු අතත. මේ පෙළ වූ කලී ගෘහ නිර්මාණ ශිල්පියෙකුගේ සැලැස්ම සේය. නිදන කාමර, කෑම කාමර, නාන කාමර මේ මේ ආකාරයෙන් මේ මේ තැන්වල තිබිය යුතු යැයි සිතාගෙන නිවසේ සැලැස්ම ගෘහ නිර්මාණ ශිල්පියා කරනු අතත. එහි එක් ගඩොලක් ගෙන් නොමැත. ගෙය මෙසේ විය යුතු යැයි සැලැස්ම පමණක් වනු අතත.

රචකයා විසින් හිම කොට අධ්‍යක්ෂක අතට පත් වන නාට්‍ය පෙළඳ, මෙවන් සැලැස්මක් වන්නේය. දෘෂ්‍ය කාව්‍ය සැබෑවක සිදුවීම් ඇදෙන්නා වූ කවියන් ගේ (නාට්‍ය රචකයන්ගේ) දුර්ලභ බව වරම්හේ නාට්‍ය ලෝකයේ ඉස්මතු වී ඇති ප්‍රබල ගැටළුවකි. ස්ථානන්තු නාට්‍ය පිටපතක් රචනා කිරීමට නොහැකි වන බොහෝයක් දෙනා විමධ්‍ය මාවත සොයනු පෙනෙයි. පරිවර්තන, අනුවර්තන හෝ පරාණි පිටපතක් ප්‍රති නිර්මාණය කිරීම වැනි විසඳුම් ඔවුන් සොයනු ඇත. හොඳම නිදසුන මෙල්බර්න් පුරාධ පැමිණෙන හෝ මෙල්බර්න් පුරයේ නිර්මාණය කරගත හැකි බව රචකයාට පෙන්වා දෙමින් දෙදෙනොගේම සතුන් විය. ස්ථානන්තු කෘති වෙනස්කම් සිදුකරලීමය. මෙය විවිධ වූ අධ්‍යක්ෂකවරුන්ගේ විවිධ වූ චරිත ස්වභාවයන් මත විවිධ අයුරින් සිදුවනු අතත.

නාට්‍ය අධ්‍යක්ෂකවරයා පෙළ විවරණය කිරීම අතිශය වැදගත්ය. අධ්‍යක්ෂකගේ විවරණය මත සාර්ථක වූ නාට්‍යය, විනාශ වූ පිටපත්ද දෙපාර්ශවයම අපට හමුවනු අතත. ලොව ප්‍රකට නාට්‍යකරුවකු වූ ඇන්ටන් චෙකෝෆ් තමාගේ නාට්‍ය පිටපත් අධ්‍යක්ෂණය කොට වේදිකා ගතකළඳ මොහොතේ ඊටා ඉතාම අසාර්ථක නාට්‍ය නිර්මාණ බවට පත්විය. නමුත් පසුකාලයක එම පිටපතම දුටු කොන්ස්ටන්ටින් ස්ටැනිස්ලාවුස්කි ඒවාට වෙනත් විවරණයක් කිරීමේ හැකියාව දක්වයිය. ඔහුගේ විවරණය සතිනව ඒ පිටපත් හැවින නිෂ්පාදනය කොට ඒ නාට්‍ය සාර්ථක නිර්මාණ බවට පත් කරලීමට ඔහු සමත් විය. ස්ටැනිස්ලාවුස්කි අධ්‍යක්ෂණයෙන් කිහිවූ නාට්‍ය නරඹූ ප්‍රේක්ෂකයන් ඉතා ප්‍රීතියෙන් ශාලාවෙන් පිටවී ගියේය. එසේම වත්මන් ලොවේ චෙකෝෆ් හොඳ නාට්‍යකරුවකු සේ ප්‍රකට වීමට මෙය උපකාර වූ බවද නොඅනුමානය.

මහාචාර්ය සරවිචන්ද්‍රයන් තම 'මහාසාර' පිටපත අධ්‍යක්ෂණය කළ අයුරුත් ජයශ්‍රී චන්ද්‍රපීති සරවිචන්ද්‍රයන්ගේ මහාසාර පිටපත සරවිචන්ද්‍රයන්ගේ 'ජේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය හැරවූ ප්‍රේක්ෂක පිරිසක් එය අසාර්ථක යැයි පැවසිය. ඉන් වැඩි දෙනා කොළඹ හතේ ඉහළ පැළැන්තියේ ඉංග්‍රීසි අධ්‍යාපනය ළත් පිරිසක් විය. මේ අයට එහි භාෂාව, සංගීතය, කථා ප්‍රවෙත් ගැඹුර වටහා ගත හැකිද? තරංග අත්‍යන්ත පිරිස අදහමෙනන් නාටකය රඟ දැක්විය. බොහෝ පිරිසක් එය නොතේරුණු බව පවසනු අසිණ. ඊට හිමි ප්‍රේක්ෂක පිරිසක් හමුවීද? නැහොත් විවරණයේ අඩුපාඩුවක්ද?

විටෙක කිරිබත්ගොඩ විහාර මහා දේවි බාලිකා විදුහලේ මනමේ රඟ දැක්විය. පළමු දර්ශනය උදෙසා ශාලාව පිරි ගියේය. ප්‍රේක්ෂකයන්ගෙන් සියයට අනූපහක් පමණ වයස අවුරුදු දෙළොහ අඩු දරුවන් විය. වැඩි පිරිස පැමිණෙන මොහොත හැරුණු කොට නාට්‍ය රඟ දැක්වූ කාලය ප්‍රාරාවට නළු නිළියන්ගේ හඬ අභිබවා ප්‍රේක්ෂාගාරයේ හඬ ඉස්මතු විය. ඒ වූ කලී සාර්ථක නාට්‍ය දර්ශණයක්ද? නාට්‍යයක් සාර්ථකවීම උදෙසා නියම ප්‍රේක්ෂකයන්ගේ දායකත්වය කෙතරම් අවශ්‍යද වැදගත්ද යන්න දැන් පෙනෙනු ඇතත.

අනෙකුත් කලා මාධ්‍යයන් අභිබවා නාට්‍ය නම් සපිරි කලා මාධ්‍යයේ සාමූහික බවත්, එහි සාර්ථකතාවය කෙතරම් පිරිසකගේ දායකත්වයක් අවශ්‍ය වන්නේද යන්නත්, ඊට ප්‍රේක්ෂක ඔබගේ දායකත්වය කෙතරම් අවශ්‍යද යන්නත් මේ ලිපියෙන් සරළව විදෙනා පානු ඇතැ'යි සිතමු. ඉදින් අවසන මෙලබේන් පුර නාට්‍ය රසිකයන් වන ඔබට මෙහි රඟ දැක්වෙන නාට්‍ය රසවිඳිමටත්ම ශිල්පීන්ගේ වෙහෙස ඇගයීමටත් අවබෝධ කොට ගැනීමටත් මෙය සුළු උපකාරයක් වේවා'යි පතමු.

කුසුම්සිරි සහ යශෝධරා

නොවැළැක්විය හැකි හේතු මත
ජගත් ජේ ඥදිසිංහ ලියන
තාරකා විජිතය නවකතාව
මෙම කළාපයේ පළ නොවන බව
කරුණාවෙන් සලකන්න